## කාලය ඉකුත් වීමේ දිනය සඳහන් කරන ආකාරය

- දිනය, මාසය, වර්ෂය යන පිළිවෙළට හෝ වර්ෂය, මාසය, දිනය යන පිළිවෙළට ඉලක්කම් වලින් දැක්විය යුතුය.
- වර්ෂය ඉලක්කම් 4 කින් ප්‍රකාශවන විට ඊට මුලින් පහත සඳහන් යෙදුම් ඇතුලත් කළ යුතුය.
    - "Expiry" හෝ එහි කෙටි යෙදුම "Exp." හෝ සිංහල කෙටි යෙදුම ''කා.ඉ.දි.'' හෝ දමිළ කෙටි යෙදුම ''கா.தேதி''
- වර්ෂය ඉලක්කම් දෙකකින් දැක්වීමේදී දිනය, මාසය, වර්ෂය සඳහා දිදි/මාමා/වව වශයෙන් හෝ වර්ෂය, මාසය, දිනය සඳහා වව/ මාමා/ දිදි යන අනුපිළිවෙලට මුද්‍රණය කළ යුතුය.
- කල් ඉකුත් වීමේ දිනය ලෙස මාසය සහ වර්ෂය පමණක් සඳහන් කරන විට, එහි කල් ඉකුත් වීමේ දිනය විය යුත්තේ සඳහන් මාසයේ අවසාන දිනයයි.
- "Expiry" වෙනුවට "Use Before", "Best Before" වැනි යෙදුම්ද භාවිතා කළ හැකිය
- පැහැදිලි ඝන අකුරින් මුද්‍රණය කල යුතුය

| | | |
|---|---|---|
| කා.ඉ.දි : | | 2016.08.20 |
| Exp : | | |
| கா.தேதி : | | |

## නිෂ්පාදිත දිනය

- වර්ෂය ඉලක්කම් 4 කින් දක්වන්නේ නම් දිනය, මාසය, වර්ෂය හෝ වර්ෂය, මාසය, දිනය ලෙස මුද්‍රණය කළ යුතුය.
- නිෂ්පාදිත දිනය පහත සඳහන් ලෙස මුද්‍රණය කළ හැකිය.
    - ''නිෂ්පාදිත දිනය'', ''නිෂ්පාදනය කරන ලද දිනය '' හෝ ඉංග්‍රිසි කෙටි යෙදුම "MFD" හෝ සිංහල කෙටි යෙදුම ''නි.දි.'' හෝ දමිළ කෙටි යෙදුම ''உ.தேதி''
- වර්ෂය ඉලක්කම් 2කින් මුද්‍රණය කරන විට දිනය, මාසය, වර්ෂය සඳහා දිදි/මාමා/වව වශයෙන් හෝ වර්ෂය මාසය, දිනය සඳහා වව/ මාමා/ දිදි යන අනුපිළිවෙලට මුද්‍රණය කළ යුතුය.
- පැහැදිලි ඝන අකුරින් මුද්‍රණය කළ යුතුය

| | | |
|---|---|---|
| නි.දි. : | | 2015.08.20 |
| MFD : | | |
| உ.தேதி : | | |

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සඳහන් ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 ඇතුළත් වන 2005 ජනවාරි 19 වැනි බදාදා නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.


**වැඩි විස්තර**

**ආහාර පර්යේෂණ ඒකකය**
**තැ.පෙ. 53**
**ගන්නෝරුව, පේරාදෙණිය**
**දු.අ. 0812 388 246 ෆැක්ස් 0812 387 398**



සැකසුම :- ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව, පේරාදෙණිය
මුද්‍රණය :- කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව, පේරාදෙණිය




# ආහාර ඇසුරුම් ලේබල් කිරීම




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2015

ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 අනුව ලේබලය ආහාර අඩංගු ඇසුරුමේ ප්‍රධාන රාමුවේ මුද්‍රණය කළ යුතුයි




## ආහාර ඇසුරුම් ලේබලයක ආකෘතිය




## ඇසුරුමෙහි ප්‍රධාන රාමුවේ මුද්‍රණය කළ යුතු දේ

- පොදු නාමය භාෂා ත්‍රිත්වයෙන් කුමන හෝ භාෂා දෙකකින් පැහැදිලි ඝන අකුරින් මුද්‍රණය කළ යුතුය.
- වර්ග නාමය හෝ වෙළඳ නාමය, භාෂා ත්‍රිත්වයෙන් එක් භාෂාවකින් හෝ වැඩි සංඛ්‍යාවකින් යුක්ත විය යුතුයි.
- ශුද්ධ බර සඳහන් කිරීමේදි ඝන ද්‍රව්‍ය සඳහා "**g**" හෝ "**kg**" ලෙසද දියරමය ද්‍රව්‍ය සඳහා "**ml**" හෝ "**l**" ලෙසද දියරමය මාධ්‍යයක අසුරා ඇත්නම් දියර ඉවත් කළ ශුද්ධ බර "**g**" හෝ "**kg**" ලෙසද ඝන අකුරින් සඳහන් කළ යුතුය.

## ඇසුරුමෙහි කුමන රාමුවක හෝ භාෂා ත්‍රිත්වයෙන් එක් භාෂාවකින් හෝ වැඩි ගණනකින් ප්‍රකාශ විය යුතු දේ

- ආහාරයට එකතු කරන ලද අවසරලත් ආහාර ආකලන ද්‍රව්‍ය නම් වශයෙන් හෝ ජාත්‍යන්තර අංක යෙදීමේ INS ක්‍රමයෙන් සඳහන් කළ යුතුය.
- ගබඩා කිරීමේ හෝ භාවිතා කළ යුතු ආකාරය දැක්වෙන උපදෙස් ඇත්නම් ඒවා සඳහන් කළ යුතුය.
- ශ්‍රී ලංකාව තුළවූ නිෂ්පාදකයාගේ සහ ඇසුරුම්කරුගේ හෝ බෙදාහරින්නාගේ නම, ලිපිනය සඳහන් කළ යුතුය.
- කාණ්ඩ අංකය (ඝන අකුරින් මුද්‍රණය කළ යුතුය)
- කාලය ඉකුත් වීමේ දිනය (ඝන අකුරින් මුද්‍රණය කළ යුතුය)
- නිෂ්පාදනය කළ දිනය (ඝන අකුරින් මුද්‍රණය කළ යුතුය)
- ආහාර තොග වශයෙන් ආනයනය කර නැවත ඇසුරුම් කර බෙදාහරින අවස්ථාවලදී නිෂ්පාදනය කළ දිනය සහ නැවත ඇසුරුම් කළ දිනය සඳහන් කළ යුතුය.
- ආහාරයට භාවිතා කළ යුතු ප්‍රමාණය අනුව අවරෝහණ ක්‍රමයට සකස් කළ, සියළුම අමුද්‍රව්‍යයන්හි පොදු නාමය ඇතුළත් ලේඛණයක් ඇතුළත් විය යුතුය.
- ආනයනික ආහාර සඳහා නම් එම ආහාර නිෂ්පාදනය කළ රට සඳහන් කළ යුතුය.

**දියරමය කිරි හෝ කාබනීකෘත ක්ෂණික බීම අඩංගු බෝතල් සඳහා නම් කාලය ඉකුත් වීමේ දිනය බෝතල් පියනේ මුද්‍රණය කළ යුතුය.**

**ලෝහමය ටින්/කෑන් වල අඩංගු ආහාර සඳහා නම් කාලය ඉකුත් වීමේ දිනය මුදුනේ හෝ පතුලේ ඇති පියන් මත මුද්‍රණය කළ යුතුය.**



## අකුරුවල ප්‍රමාණය

- ප්‍රධාන රාමුවෙහි පොදු නාමය මුද්‍රණය කළ යුතු අකුරු වල ප්‍රමාණය, වර්ග නාමය මුද්‍රණය කළ යුතු අකුරු වල ප්‍රමාණයෙන් 1/3 කට වඩා අඩු නොවිය යුතු අතර අවම උස මිලි මීටර් 3 ක් විය යුතුය.
- අතිරේක රාමුවක පොදු නාමය මුද්‍රණය කරන විට ප්‍රධාන රාමුවෙහි මුද්‍රණය කර ඇති පොදු නාමයෙහි අකුරු වල උසින් අඩකට වඩා අඩු නොවිය යුතු අතර මිලි මීටර් 3ක අවම උසකින් යුක්ත විය යුතුය.
- ඇසුරුමෙහි ශුද්ධ බර ග්‍රෑම් 25 නොඉක්මවන විට හා ශුද්ධ පරිමාව මිලි ලීටර් 30 නොඉක්ම වන විට අකුරු වල අවම උස මිලි මීටර් 1.5 ට අඩු නොවිය යුතුය.
- බීම බෝතල් වල පියනේ මුද්‍රණය කරන අකුරු වල උස මිලි මීටර් 1 ට අඩු නොවිය යුතුයි.